# පියෙකුගෙන් පුතෙකුට හෝ දුවකට
# From a father to a son or daughter

Life, fortune and mishaps are unpredictable, nobody knows how long he lives. Some words are better said early.

**I am your father, and if I don't tell you these, no one else will.**

What is written is my own personal bitter experiences that perhaps could save you a lot of unnecessary heartaches.

**Remember the following as you go through life.**

1. Do not bear grudge towards those who are not good to you. No one has the responsibility of treating you well, except your mother and I. To those who are good to you, you have to treasure it and be thankful, and ALSO you have to be cautious, because, everyone has a motive for every move. When a person is good to you, it does not mean he really likes you. You have to be careful, don't hastily regard him as a real friend.

2.No one is indispensable, nothing in the world that you must possess. Once you understand this idea, it would be easier for you to go through life when people around you don't want you anymore, or when you lose what / who you love most.

3.Life is short. When you waste your life today,tomorrow you would find that life is leaving you. The earlier you treasure your life, the better you enjoy life.

4.Love is but a transient feeling, and this feeling would fade with time and with one's mood. If your so called loved one leaves you, be patient, time will wash away your aches and sadness. Don't over exaggerate the beauty and sweetness of love, and don't over exaggerate the sadness of falling out of love.

5.A lot of successful people did not receive a good education, that does not mean that you can be successful by not studying hard! Whatever knowledge you gain is your weapon in life. One can go from rags to riches, but one has to start from some rags!

6.I do not expect you to financially support me when I am old, either would I financially support your whole life. My responsibility as a supporter ends when you are grown up. After that, you decide whether you want to travel in a public transport or in your limousine, whether rich or poor.

7.You honour your words, but don't expect others to be so. You can be good to people, but don't expect people to be good to you. If you don't understand this, you would end up with unnecessary troubles.

8. I have bought lotteries for umpteen years, but I never strike any prize. That shows if you want to be rich, you have to work hard! There is no free lunch !

9.No matter how much time I have with you, let's treasure the time we have together. We do not know if we would meet again in our next life.



ජීවිතය, වාසනාව හා අවාසනාව ගැන අපට නිශ්චිතව කිව නොහැකිය. තමන් කොපමණ කල් ජීවත්වනවාදැයි කිසිවෙක් නොදනිති.

මා නුඹෙ පියාය. මා නොකිව්වොත් මේවා වෙන කිසිවෙකු නුඹට නොකියනු ඇත. මෙහි ලියන සෑම දෙයක්ම මා අත්දැක ඇති දේ වෙයි. එනිසා මේ දේවල් ජීවිතයේ ඉදිරියට යන විට හොඳින් සිහි තබාගන්න.

කෙනෙකු නුඹට හොඳින් සැලකුවේ නැත්නම් ඒ අය හා අමනාප විය යුතු නොවේ. එසේ හොඳින් සලකන්නට මාත් නුඹෙ අම්මාත් හැර වෙන කිසිවෙකු බැඳී නැත. කෙනෙක් හොඳින් සැලකුවහොත් එය අගේ කරනවා මෙන්ම ඔවුන්ට ස්තුතිපූර්වක වන්න. එසේම පරෙස්සම්ද විය යුතුයි. මක්නිසා ද හැම කෙනෙකුගේම හොඳ ක්‍රියාවක් පිටුපස යටි අදහසක් ද ඇත. කෙනෙක් හොඳින් සලකන්නේ ඒ තැනැත්තා නුඹ ප්‍රිය කරන නිසාමයයි නොසිතන්න. ඔහු නියම මිතුරෙකැයි සිතා එක්වරම බදා වැළඳ ගන්න යන්න එපා. පරෙස්සම් වන්න!

මේ ලෝකයට ඉතා අත්‍යවශ්‍ය හෝ නැතුවම බැරි දේ යයි කියන්නට හෝ කිසිවක් ඇත්තේ නැත. ඒ කිසිවක් නැතිවුනාට ලෝකෙට පාඩුවක් නැත. මේ බව වටහාගත් විට ජීවිතය පහසුය. එවිට තමන් සතුව තිබූ කුමක් නැතිවී ගියත් කවුරු තරහ වුනත් කමක් නැත.

ජීවිතය කෙටිය. නුඹ අද ජීවිතය නාස්ති කළොත් ජීවිතය නුඹ හැරදමා යන්නට යන බව හෙට නුඹට වැටහෙනවා ඇත. ඒ නිසා මුල සිටම තමාට ලැබී ඇති ජීවිතය හැම මොහොත කම අගය කරන්නට පුරුදු වෙන්න.

ආදරය යනු ස්ථිරව නොපවතින හැඟීමකි. මෙම හැඟීම කාලයත් සමග කෙනෙකුගේ සිතේ ස්වභායත් සමග වෙනස්වෙමින් ටික ටික මැකී යන්නට පටන් ගනී. නුඹ ආදරය කරන තැනැත්තා හෝ තැනැත්තිය අතහැර ගියහොත් හිත හදාගෙන ඉවසා ගෙන ඉන්න. කාලය විසින් ඒ සියළු හර්දවේදනා සෝදා හරිනවා ඇත. ආදරයේ සුන්දරත්වය මිහිරි කම ගැන අතිශයෝක්තියෙන් සිතන්නට එපා. එසේම ආදරයක් කැඩීගිය කල ඉන් ඇතිවන වේදනාව ගැන ද මහමෙරක් සේ පමණට වඩා බොරු ගැඹුරකින් සිතන්න යන්නත් එපා.

බොහෝ සාර්ථක මිනිස්සු හොඳ අධ්‍යාපනයක් ලත් අය නොවේ. ඒ කියන්නේ මහන්සි වී ඉගෙන නොගෙන නුඹට සාර්ථක විය හැකියයි කියා නොවේ. ඔබ ජීවිතයේ ලබන කුමන හෝ දැනුමක් වේ නම් එය ජීවිතය ගෙනයාමට හොඳ ආයුධයක් වනවා නිසැකය. ඉතා සුළුවෙන් පටන් ගෙන මහා ධනවතුන් වූ අය ගැන අප අසා ඇත. ඒ ඔවුන් සුළුවෙන් වුවද යමක් පටන් ගත් නිසාය.

මා වයසට ගිය කල නුඹ මා නඩත්තු කරාවියැයි, මට මුදලින් ආධාර කරාවියැයි මම බලාපොරොත්තු නොවෙමි. එලෙසම නුඹ තරුණ වියට එළඹුණු විට මගේ නුඹට වියහියදම් සැපයීම නුඹව බලාකියා ගැනීමේ වගකීම අවසන් වෙයි. ඊට පසු නුඹ පාරේ බස් එකේ ගමන් කරනවාද, නැත්නම් නුඹේම ලොකු කාර් එකක යනවාද යන්න නුඹ ගතයුතු තීරණයකි. පොහොසත්වීම හෝ දුප්පත්වීම නුඹට අයත් දෙයකි.

නුඹ අවංකවම කියන දේ අකුරටම ඉටුකරන කෙනෙක් විය හැකිය. එහෙත් අනෙක් අයත් එසේ යයි නොසිතන්න. මෙය තේරුම් ගැනීම අනවශ්‍ය කරදරවලින් බේරීමකි.

මා මතක ඇති කාලයේ පටන් ලොතරැයි අරගෙන ඇතත් කිසිදාක දිනුමක් ලබා නැත. ඉන් කියන්නේ පොහොසත් වන්නට නම් මහන්සි වී වැඩ කළ යුතු බවයි. කිසිවක් නිකම් නොලැබේ.

නුඹත් මමත් දැනට එකට සිටින නමුත් මා මෙලොවින් ගිය දාක යළි හමුවේදැයි නොදනිමි. ඒ නිසා මේ පවතින කාලය සතුටෙන් මිස දුකෙන් ගත කළ යුතු නොවේ.

♦ **Deepa Sandamali Herath USA**

## ලන්ඩනයේ ශ්‍රීලංකා මහා ක්‍රිකට් සැණකෙළිය
**Sunday 10th July 2011**




## Mahesh & Oshani
## මහේෂ් - ඔෂානි

**මහේෂ් අබේරත්න සහ ඔෂානි ජයවර්ධන තරුණ යුවළගේ විවාහය පසුගිය මස බටහිර ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේදී සිදුවිය.**

The wedding of **Mahesh Abeyratne** and **Oshani Jayawardena** took place Saturday, March 12, 2011 in Perth, Western Australia.

Mahesh is the son of Mr Saddamangala Abeyratna and late Mrs Dhammi Abeyratna.

Oshani is the daughter of Mr Nalin Jayawardena ( Perth based Srilankan singer & musician) and Mrs Renuka Jayawardena.

**Here our best wishes to the newly weded couple.**

" Wishing you a rainbow,
for sunlight after showers...

Miles and miles of smiles for golden happy hours.....

Shamrocks at your doorway,
for luck and laughter too....

And a host of friends that never ends;

Each day your whole life through.....! "

♦ **Lanka Viththi**

## Wedding Greetings! සුබ මංගලම්!

